# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 977/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 10/06/2024 පැය 1445

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. විදුලිසැර වැදී කාන්තාවක් මියයාම - රාගල පොලිස් වසම.**

2024.06.09 වන දින සවස් කාලයේ රාගල පොලිස් වසමේ ගෝනබොක්ක ප්‍රදේශයේ කාන්තාවක් විදුලිසැර වැදී මියගොස් ඇති බවට රාගල පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 57ක් වූ සෙනරත්පුර, රාගල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අනවසරෙන් ඇද තිබූ විදුලි රැහැනක පැටලීමෙන් මෙම මරණය සිදුව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා නුවරඑළිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර රාගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.06.09 වන දින කෙසෙල්වත්ත පොලිස් වසමේ ප්‍රින්ස්ගේට් හන්දිය ප්‍රදේශයේදී කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 31 මිලිග්‍රෑම් 100 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කෙසෙල්වත්ත පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 55 ක් වන සේදවත්ත පාර, වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කෙසෙල්වත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.06.09 වන දින සවස් කාලයේ මහරගම පොලිස් වසමේ ඇරැව්වල ප්‍රදේශයේදී බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 101 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මහරගම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන අහංගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මහරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - මත්තේගොඩ පොලිස් ස්ථානය.**

2024.06.09 වන දින සවස් කාලයේ මත්තේගොඩ පොලිස් වසමේ දොලේකඩේ ප්‍රදේශයේදී මත්තේගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200ක් සමග සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 39ක් වන දීපංගොඩ, හෝමාගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මත්තේගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොල්පිතිගම පොලිස් ස්ථානය.**

2024.06.09 වන දින දහවල් කාලයේ පොල්පිතිගම පොලිස් වසමේ ඉහලවෙල ප්‍රදේශයේදී පොල්පිතිගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් ලීටර් 77 (බෝතල් 103)ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන මාඑළිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොල්පිතිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**